සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

බුද්ධ ධර්මය - 3 - ශ්‍රේණිය

තෙවන වාරය - 5 වන සතිය

සැකසුම - බළන්ගොඩ අධ්‍යාපන කලාපය

**පාඩම- 17 , වඩමු ගුණදම් / 18 , මේ අපේ නිවහන**

❖ **වාචික පිළිතුරු අපේක්ෂිත ප්‍රශ්න.**

(1) ඔබ පාඩමින් හඳුනාගත් ගුණදම් තුනක් සදහන් කරන්න.

(2) ඔබ විසින් යහළුවෙකුට සිදුකළ යහපත් දෙයක් විස්තර කරන්න.

(3) හොඳ මිතුරෙකු හඳුනාගත හැකි ආකාරයක් කියන්න.

(4) සුභාෂිත වචනයක් ඇතුළත් වැකියක් කියන්න.

(5) ලද දෙයින් සතුටුවීම ගැන කතාවක් පන්තියට ඉදිරිපත් කළේ කවුරුන් ද?

(6) පන්සිල් පද ශබ්ද නගා කියන්න.

(7) පවුලේ සැම එකතු වී නිවසේ දී කළ යහපත් ක්‍රියාවක් කියන්න.

(8)නිවස පිරිසිදුව තබා ගැනීමට ඔබට කළ හැකි දෙයක් කියන්න.

(9) ඔබගේ මිදුලේ වගාකර ඇති මල් ගස් කිහිපයක නම් කියන්න.

(10) අම්මාට තාත්තාට උදවු කළ අවස්ථාවක් කියන්න.

❖ **ලිඛිත පිළිතුරු සපයන්න.**

- පහත වගන්ති හරිනම් ( √ ) ලකුණ ද වැරදි නම් ( X ) ලකුණ ද යොදන්න.

(1) ස්වාමීන් වහන්සේ කෙනෙකු දුටුවිට වැද නමස්කාර කාරීම යහපත් ක්‍රියාවකි. ( )

(2) ලද දෙයින් සතුටුවීමට අප නිතර පුරුදු පුහුණු විය යුතුය. ( )

(3) අප හැම විටම යහළු , යෙහෙළියන්ට උදවු නොකළ යුතුය. ( )

(4) නිවස අවට පරිසරය අලංකාර කර ගැනීමට අප දෙමාපියන්ට උදවු කළ යුතුය. ( )

(5) හැමට ආදරය කරුණාව දැක්වීමට අප කුඩා කළ සිටම හුරුවිය යුතුය. ( )

- **පහත පිළිතුරු අතරින් වචන ගෙන හිස්තැන් සම්පූර්ණ කරන්න.**

( යහපත් මිතුරා / ගෙවත්ත / සුභාෂිත / දෙමාපියන්ට / උසස් )

(1) .......................... තමන් නිතර වැරදිවලින් වළක්වයි.

(2) .......................... වචන යනු තමන්ටත්, අනුන්ටත් ප්‍රිය උපදවන, සිත සතුටු කරවන වචනය.

(3) පවුලේ සියලු දෙනාම එක් වී සමඟියෙන් .......................... පිරිසිදු කරමු

(4) ඇත්ත කතා කිරීම ඉතා.......................... ගුණාංගකි

(5) තමන්ට කැමති කැමති දේවල් ඉල්ලා .......................... කරදර නොකළ යුතුය.